සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 05

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

කාලය : පැය එකයි

විභාග අංකය : ...................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | |
| | V/II/S/CH |


➢ **පහත ඇති රූප නිරීක්ෂණය කර අංක (1) සහ (2) ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**


(1) කොටුව තුළ ඇති චිත්‍රයට වඩාත් සමාන වන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද?



(1) (2) (3)

(2) A රූපයට සමාන රූපයක් ලබා ගැනීමට B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කිය ද?








A රූපය B රූපය

(1) 4 (2) 2 (3) 3


➢ පහත කොටු තුළ ඇති රූප නිරීක්ෂණය කරන්න. එක් එක් රූපය සඳහා ඉංග්‍රීසි අකුරු යොදා ඇත. එම රූපවල සම්බන්ධතා දැක්වෙන පරිදි රූප යුගල කොට ඇති නිවැරදි පිළිතුර තෝරන්න.

(3)

| | | | |
|---|---|---|---|
| A  | B  | C  | D  |
| E  | F  | G  | H  |

(1) AB , DH, CG , EF (2) AH , BF, CE, DG (3) AH , BC, EF, DG

(4) පහත ඝනක තුනෙහි ඉංග්‍රීසි අක්ෂර පිහිටා ඇති ආකාරය අනුව B ට විරුද්ධ පැත්තේ ඇත්තේ,




(1) E (2) D (3) A

විභාග අංකය - ------------------------------------

(5) මුලින් දී ඇති රූපය සෑදීමට එකතු කළ යුතු කොටස තෝරන්න.




(1) (2) (3)

(6) රූපයේ දැක්වෙන ආකාරයට දාදු කැටයේ ප්‍රතිවිරුද්ධ පැතිවල සංඛ්‍යා ලියා ඇත්තේ මෙසේ ය.

5 → 28

10 → 38

15 → 48





දාදු කැටයේ 10 සහ 28 ඉදිරිපස දෙපසේ දිස්වන සේ වැටුණු විට උඩ ඇති අංකය කුමක් ද?

(1) 5 හෝ 48 (2) 5 හෝ 38 (3) 15 හෝ 48

(7) මෙම රූපයේ ත්‍රිකෝණ 15 ක් ඇත. එයින් ත්‍රිකෝණ 6 ක් ලබා ගැනීමට ඉවත් කළ යුතු රේඛා ගණන වන්නේ,

(1) 2
(2) 3
(3) 1



(8) පාරක් කැපීමට මිනිසුන් 10 දෙනෙකුට දින 20 ක් ගත වේ. මිනිසුන් 10 දෙනා දින 14 ක් වැඩකළ පසු ඉතිරි දින කිහිපය මිනිසුන් පස් දෙනෙක් වැඩ කිරීමට ආවේ නැත. ඉතිරි පිරිස එම වැඩය නිම කිරීමට තව දින කීයක් වැඩිපුර වැඩ කළ යුතු ද?

(1) 6 (2) 12 (3) 18

(9) රුවනි ගැහැනු ළමයෙකි. ඇයගේ අයියාට සහෝදරයෝ 3 දෙනෙක් සහ සහෝදරියෝ 4 දෙනෙක් සිටිති. රුවනි ට සිටින සහෝදරයන් සහ සහෝදරියන් ගණන කීය ද?

(1) සහෝදරයෝ 3 , සහෝදරියෝ 4


(2) සහෝදරයෝ 4 , සහෝදරියෝ 3

(3) සහෝදරයෝ 4 , සහෝදරියෝ 4

(10) මකන 4 ක් සහ පැන්සල් 5 ක මිල මකන 2 ක් සහ පැන්සල් 11 ක මිලට සමාන ය. මකන 5 ක මිලට සමාන වන්නේ පැන්සල් කීයක මිල ද?

(1) 16 (2) 15 (3) 18

➢ රූපයේ දැක්වෙන්නේ පාපැදිකරුවෙකු ආරම්භක ස්ථානයෙන් ගමන් අරඹා නැවත එම ස්ථානයට පැමිණි මාර්ගයයි.




(11) ආරම්භක ස්ථානයට පාපැදිකරු නැවත පැමිණෙන විට වම් පසට හා දකුණු පසට හැරුණු වාර ගණන පිළිවෙලින් කිය ද?

(1) 4 හා 2 (2) 1 සහ 5 (3) 5 හා 1

(12) නැවත ආරම්භක ස්ථානයට පැමිණෙන විට පාපැදිකරු ගමන් කර ඇති මුළු දුර කිය ද?

(1) 36km (2) 38 km (3) 40 km

(13) රුවන් මිනිත්තු 10 ක දී සේපාලිකා මල් 20 ක් ඇහිඳින අතර ගයාන් මිනිත්තු 5 ක දී සේපාලිකා මල් 15 ක් ඇහිඳින අතරේ දී කමල් මිනිත්තු 2 ක දී සේපාලිකා මල් 8 ක් ඇහිඳී. වැඩිම වේගයකින් මල් ඇහිඳින්නේ කවු ද?

(1) කමල් (2) ගයාන් (3) රුවන්

(14) නිවසක ජල බිල්පතක් වෙනුවෙන් මුල් ඒකක 30 සඳහා රුපියල් 15 බැගින් ද ඉන් අනතුරුව වැඩිවන සෑම ඒකකයක් සඳහා ම රුපියල් 5 ක් වැඩියෙන් ද ගෙවීමට සිදුවේ එම නිවසේ මේ මස ඒකක 55 ක් පරිභෝජනය කර තිබුණේ නම් ගෙවිය යුතු මුදල කිය ද?

(1) රුපියල් 950.00 (2) රුපියල් 875.00 (3) රුපියල් 110.00

➢ **අමර, කමල් , නයනා අත මුදල් නෝට්ටු හෝ කාසි ඇත. අමර ළඟ ඇති මුදල මෙන් දෙගුණයක් කමල් ළඟ ඇත. කමල් ළඟ ඇති මුදල මෙන් තුන් ගුණයක් නයනා ළඟ ඇත. තුන් දෙනා ළඟම ඇති මුළු මුදල රුපියල් 180.00 කි.**

(15) කමල් සහ නයනා අත ඇති මුළු මුදල කිය ද?

(1) රුපියල් 120.00 (2) රුපියල් 160.00 (3) රුපියල් 140.00


(16) තෙහාෂා උදෑසන පාසල් යන විට එක්තරා දිශාවකට මීටර 300 ක් ගමන් කර තම වම් අත පැත්තට හැරී මීටර 100 ක් ගමන් කළා ය. ඇය මීටර 100 ක දුර ගමන් කිරීමේදී ඇගේ සෙවණැල්ල ඇගේ දකුණු අත පැත්තට වැටී තිබුණේ නම් ඇය මීටර 300 ක දුර ගමන් කර ඇත්තේ කුමන දිශාවකට මුහුණලා ද?

(1) නැගෙනහිර දිශාව (2) දකුණු දිශාව (3) බස්නාහිර දිශාව

(17) බෝට්ටුවක වරකට ගෙන යා හැකි උපරිම බර 200 kg කි. මිනිසෙකුට 40 kg , 80 kg , 60 kg 140 kg , 160 kg හා 120 kg බැගින් වූ එළවළු ගෝනි 6 ක් ගඟෙන් එතෙර කරවීමට අවශ්‍යව ඇත. මේ සඳහා බෝට්ටුව ගඟෙන් එතෙරට පැදවිය යුතු අවම වාර ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 5

(18) කළු හා සුදු පාට පබළු යොදා ගනිමින් සකස් කරන ලද පබළු වැලක් පහත දැක්වේ. එය ත්‍රිකෝණාකාර හැඩයේ ආභරණයක් ලැබෙන සේ සකස් කළ විට ලැබෙන නිවැරදි රූපය තෝරන්න.



(1) (2) (3)

➢ **අද බදාදා ය. අක්කා නුවර ගියේ පළමු දා ය. ඉන් අනිද්දා දිනය වන්නේ 24 වැනි දා ය. එදින රුවනිගේ උපන් දිනයයි.**

(19) අක්කා නුවර ගිය දිනය හා දවස කවදා ද?
(1) 19 සඳුදා (2) 18 ඉරිදා (3) 20 අඟහරුවාදා

(20) රුවනිගේ උපන් දිනය යෙදෙන දවස කවදා ද?
(1) බදාදා (2) සිකුරාදා (3) සෙනසුරාදා

➢ **A , B** නගර දෙකකි. දිනක් උදේ 6.00 ට තුෂාර **A** සිට **B** දක්වා පැයට **3 km** බැගින් වේගයෙන් **B** දෙසට යයි. නුවන් ඒ මොහොතේ ම **B** සිට **A** දක්වා ගමන් අරඹා පැයට **2 km** ක වේගයෙන් යයි.




(21) තුෂාර සහ නුවන් හමුවන වේලාව කීය ද?
(1) පෙරවරු 8.00 (2) පෙරවරු 9.00 (3) පෙරවරු 10.00

(22) තුෂාර සහ නුවන් හමුවන්නේ **A** සිට කිලෝමීටර කීයක දුරින් ද?
(1) 9 km (2) 10 km (3) 8 km

(23) ශාලාවක පුටු තබා ඇත්තේ වෘත්තාකාරව ය. එහි පුටු තබා තිබුණේ වට දෙකක් සෑදෙන සේය. පුටුවල අංක දමා තිබුණු අතර අංක 1 පුටුවට ඉදිරියෙන් අංක 08 පුටුව තබා ඇත. ඒ අනුව දෙවන පේළියේ පුටු තබා ඇත්තේ පළමු පේළියේ අංක 1 පුටුවට පිටුපසින් 15 පුටුව වන පරිදි ය. පළමු පේළියේ සෑම පුටුවක් පිටුපසින් ම දෙවන පේළියේ පුටු සමානව තබා තිබුණේ නම් පළමු පේළියේ 10 වන පුටුවට පිටුපසින් දෙවන පේළියේ ඇති පුටුවේ අංකය වන්නේ,

(1) 22 (2) 24 (3) 25

(24) ශ්‍රී ලංකාවේ වේලාව එංගලන්තයේ වේලාවට වඩා පැය 5 මිනිත්තු 30 ක් වැඩිය. ශ්‍රී ලංකාවේ වේලාව පස්වරු 4.00 වන විට එංගලන්තයේ වේලාව කීය ද?

(1) පෙරවරු 11.30 (2) පෙරවරු 10.30 (3) පෙරවරු 9.30

(25) පහත දැක්වෙන්නේ කුමාරිගේ පරිගණකයේ ඉලක්කම් වලින් දමා ඇති අංක පුවරුවකි. එහි පරිගණකය භාවිතා කිරීම සඳහා ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක් තිබිය යුතු ය. එම පුවරුවේ තිරස් අතටත් සිරස් අතටත් මුල්ලෙන් මුල්ලටත් ඉලක්කම් එකතු කළ විට ලැබෙන පිළිතුරුවලින් වැඩි වාර ගණනක් ලැබෙන පිළිතුරට අයත් ඉලක්කම් දෙක ඊට අයත් ය. එම ඉලක්කම් දෙක මොනවාද?

| | | |
|---|---|---|
| 1 | 6 | 7 |
| 2 | 5 | 8 |
| 3 | 4 | 9 |

(1) 1 සහ 4


(2) 1 සහ 5

(3) 2 සහ 4

(26) A සහ B යනුවෙන් මල් වට්ටි දෙකකි. A මල් වට්ටියේ ඇති මල් මෙන් $\frac{1}{3}$ B මල් වට්ටියේ ඇත. A මල් වට්ටියෙන් මල් 8 ක් B මල් වට්ටියට දැමූ විට වට්ටි දෙකේ ම මල් සමාන ය. A මල් වට්ටියේ මුලින් ම තිබූ මල් ප්‍රමාණය කොපමණ ද?

(1) 12 (2) 18 (3) 24

(27) පහත සඳහන් දම්වැල කැබලි 5 කට වෙන්කළ පසු එම කැබලිවල එක කැබැල්ලක තිබිය හැකි උපරිම පුරුක් ගණන කීය ද?




(1) 8 (2) 5 (3) 21

(28) පහත සටහනේ එක් එක් කොටුව තුළ සඳහන් ආහාර වර්ගය එයට ඉදිරියෙන් සහ පහළින් නම් සඳහන් ළමයින් විසින් ආහාරයට ගෙන ඇත. රොටී සහ තවත් ආහාර වර්ගයක් හතර දෙනාම ගෙන ඇත්නම් හිස් කොටුවේ සඳහන් විය යුතු ආහාර වර්ගය කුමක් ද?

| | සිතිජ | රුවන් | මනීෂ |
|---|---|---|---|
| | | | රොටී |
| | | ............ | බනිස් |
| ගගනි | රොටී | කිරිබත් | පාන් |

(1) කිරිබත් (2) බනිස් (3) පාන්

(29).




මෙහි දැක්වෙන්නේ ළමයි පිරිසක් ක්‍රීඩාවක් සඳහා සිටින ආකාරයයි. එක් බෝලයකින් ළමයි 10 ක් නිරූපණය වේ. මෙම ක්‍රීඩාව දක්ෂිණාවර්තව සිදු වේ. එක් රේඛාවක සිට තවත් රේඛාවකට පිළිවෙළින් ගමන් කිරීමේ දී සෑම අවස්ථාවකම බෝල දෙකක් වැඩිවන අතර ළමයි 5 ක් අඩුවෙයි. ඒ අනුව A B ආරම්භක රේඛාව දක්ෂිණාවර්තව වටයක් ගොස් එම ස්ථානයට පැමිණෙන විට ඒ මොහොතේ ඒ රේඛාවේ සිටින මුළු ළමයි ගණන කීය ද?

(1) 110 (2) 155 (3) 170

(30) නයනා, කුමාරි , කමල් , විදත් , මාලා , රනුකි සහ දසුන් යන යහළුවන්ගේ නිවාස එක පැත්තක එක දිගට පිහිටා ඇත. එම නිවාස 7 ට අංක යොදා ඇත්තේ පිළිවෙළින් 2 , 4 , 6 , 8 , .... යනාදි ලෙසිනි. එක ළඟ පිහිටි ගෙවල් 3 ක අංකවල එකතුව 30 කි. එසේ නම් දසුන්ට සහ විදත් ට හිමි නිවාසවල අංකය කුමක් විය හැකි ද?

(1) 12 සහ 8 (2) 14 සහ 8 (3) 10 සහ 6

(31) මා ළඟ බෝල පාට තුනකින් ඇත. ඒවා දමා ඇත්තේ වෙනස් පාට තුනක පෙට්ටි තුනක ය. රතු බෝලය නිල් පාට පෙට්ටියේ ද කොළ බෝලය කහ පාට පෙට්ටියේ ද තැඹිලි පාට බෝලය රෝස පාට පෙට්ටියේ ද දමා ඇත. මා හට කොළ බෝලයක් සහ රතු පාට බෝලයක් ලබා ගැනීමට අත දැමිය යුතු පෙට්ටිවල පාට පිළිවෙළින්,

(1) නිල් පාට සහ කහ පාට

(2) නිල් පාට සහ රෝස පාට

(3) කහ පාට සහ නිල් පාට

(32) වත්තක තිබූ ගස් අතරින් අඹ ගස් සහ පේර ගස් එකිනෙකට සමාන ය. පේර , රඹුටන් , අඹ යන ගස් සියල්ලේ ම එකතුවට දෙහි ගස් ප්‍රමාණය සමාන ය. දෙහි ගස්වලින් අඩක් රඹුටන් ගස් ඇත. මෙම තොරතුරු සඳහා වඩාත් සුදුසු සටහන තෝරන්න.



(1)




(2)




(3)

(33) දී ඇති රූපයේ දැකිය හැකි මුළු ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 5 (2) 6 (3) 3

➢ **පහත දැක්වෙන්නේ ළමයෙක් ඝණක කිහිපයක් එකිනෙක තබා ගොඩනගා තිබෙන අන්දම දැක්වෙන රූප සටහනකි. එය ඇසුරෙන් (34) (35) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(34) මෙහි මුහුණත් තුනක් පමණක් අනෙක් ඝනකවලට ස්පර්ශ වී ඇති ඝනක සංඛ්‍යාව කීය ද?


(1) 2 (2) 3 (3) 1

(35) මෙම ඝනක සම්බන්ධ කර ලොකු ඝනකයක් සාදා ගැනීමට මෙහි සඳහන් කුඩා ඝනකවලට අමතරව තව දුරටත් අවශ්‍ය වන කුඩා ඝනක සංඛ්‍යාව කීය ද?


(1) 21 (2) 27 (3) 20

(36) පහත දැක්වෙන ඝනකය රූපයේ පෙනෙන කඩඉර දිගේ දෙකට කැපූ පසු කැපුණු මුහුණතක හැඩය වනුයේ ,



(1) 

(2) 

(3) 

➢ පහත කවිය ඇසුරෙන් (37) (38) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙහි දෙවියත්
අඟුරු සුදුවන කලක් නම් නැත්

(37) සේදුවත් යන අදහස දීමට කවියේ යෙදී ඇති වචනය කුමක්ද?

(1) අඟුරු (2) දෙවියත් (3) ගුණ

(38) අයහපත් මිනිසුන් හැඳින්වීම සඳහා කවියේ යොදා ඇති වචනය කුමක් ද?

(1) යහපත් (2) ගුණ (3) දුදනෝ

➢ පහත දැක්වෙන්නේ වෙළෙඳ සැණකෙළියක අලෙවි කුටි සකස් කර තිබූ ආකාරය යි. ඒ අනුව (39) (40) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| 2025 වෙළෙඳ සැණකෙළිය | | | |
|---|---|---|---|
| 1 කුටිය | 2 කුටිය | 3 කුටිය | 4 කුටිය |
| ක්‍රීඩා භාණ්ඩ | විසිතුරු මල් | රෙදිපිළි | සෙල්ලම් භාණ්ඩ |

(39) පිත්තක් සහ සෙල්ලම් කාරයක් ගැනීමට යා යුතු කුටි දෙක වන්නේ,

(1) 1 කුටිය හා 3 කුටිය

(2) 2 කුටිය හා 4 කුටිය

(3) 1 කුටිය හා 4 කුටිය

(40) දෙක හා තුන කුටිවලින් මිලදී ගත හැක්කේ,

(1) බෝලයක් හා ඕකිඩ් (2) සරමක් හා පිත්තක් (3) ඕකිඩ් හා සරමක්

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education – Western Province**

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 05

**EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES**
පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

කාලය : පැය එකයි මි. 15

II පත්‍රය

විභාග අංකය : ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | |
| | V/I/S |
| දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |

(1) ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වයස අවුරුදු තුනේ දී හදිසි අනතුරකින් සදහට ම දෘශ්‍යාබාධිත තත්ත්වයකට පත් වූ පුංචි ලුයිට දිනෙන් දින මුහුණ පාන්නට සිදු වූ අභියෝග රැසකි. ඒ අභියෝග ජය ගනිමින් දෙනෙතින් නොව සවනින් ලෝකය හඳුනා ගත් ඔහු ලුයි බ්‍රේල් ය. දෘශ්‍යාබාධිත පුද්ගලයන් භාවිත කරන කියවීමේ හා ලිවීමේ ක්‍රමය වන බ්‍රේල් ක්‍රමය සොයා ගත් ඔහු ප්‍රංශ ජාතිකයෙකි. ඔහුගේ චරිතය ඇසුරෙන් මාග්‍රට් ඩේවිඩ්සන් රචනා කළ "ලුයි බ්‍රේල්" කෘතිය එඩනා මල්කාන්ති මහත්මිය විසින් සිංහලයට පරිවර්තනය කර තිබේ.

1) ඡේදයෙන් විස්තර වන්නේ කවුරුන් පිළිබඳව ද?

..........................................................................................................................................

2) ඔහු කුමන ජාතිකයෙක් ද? ..........................................................................................

3) බ්‍රේල් ක්‍රමය යනු කුමක් ද? ......................................................................................

..........................................................................................................................................

4) ඔහු ලෝකය හඳුනා ගත්තේ කෙසේ ද? ..........................................................................

5) පෙනීමේ දුබලතා සහිතවම යන අදහස දෙන පදය ඡේදයෙන් තෝරා ලියන්න

..........................................................................................................................................

6) ගැට ඇලපිල්ල සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න.

..........................................................................................................................................

(2) පහත එක් එක් වගන්තියේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද වරහන තුළ යොදන්න.

1. අපි අධ්‍යාපන චාරිකාවක් ගියෙමු. ( )
2. කිරිල්ලිය අත්තක වසා සිටියේ ය. ( )
3. සියලු කටයුතු නිමකර උත්සවය ආරම්භ කිරීමට ගුරුවරු සූදානම් වූහ. ( )
4. කුමාර මිහිරි ලෙස ගියක් ගයයි. ( )

(3) මෙම වාක්‍යයේ ඇති උපමාව සොයා තිත් ඉර මත ලියන්න.

පුංචි කුඹි පෙළ ගැහිලා කළු සායම් ඉරක් වගෙයි.

..........................................................................................................................

(4) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. සමස්ථ 2. සමස්ත 3. සමග්‍ත

(5) ගැළපෙන විරාම ලකුණු යොදන්න.

1. සීයේ සීයේ අඳත් කතන්දරයක් කියන්නකෝ

2. ප්‍රස්තාව පිරුළු කියන්නේ මොනවා ද සීයේ

විභාග අංකය - ----------------------------------

(6) පහත දී ඇති වචනවල මුල අකුරේ ශබ්ද අනුව වගුව සම්පූර්ණ කරන්න.

වෛරය , පෞද්ගලික

කෝලිත , පිරිසිය

| “ඊ” ශබ්දය | “ ඖ” ශබ්දය | “ ඕ” ශබ්දය | “ ඓ” ශබ්දය |
|---|---|---|---|
| ............................................ | ............................................ | ............................................ | ............................................ |

(7) “ විමසීමකින් තොරව යමක් කිරීම ” යන අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ කුමක් ද?

.................................................................................................................................................................

(8) පහත වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

1. තරුණිය ලස්සන නාට්‍ය ගීතයක් ගායනා කළා.

----------------------------------------------------------------------------------------------------------------

2. සරුංගලයක් ඈත අහසේ පාවෙනවා.

----------------------------------------------------------------------------------------------------------------

3. ධීවර පිරිසක් ළමයින්ට අත වැනුවා.

----------------------------------------------------------------------------------------------------------------

(9) හිස්තැනට වඩාත් සුදුසු යෙදුම වරහන් තුළින් තෝරා ලියන්න.

( එක හුස්මට , අකුරක් නෑර , ඉහේ මලක් පිපුණා වගේ , මොර සූරන වැස්සේ )

1. තාත්තා ........................................................................................ නිවසට පැමිණියේ ය.

2. ගුරුතුමිය ළමයින්ගේ රචනා ........................................................................................ කියෙවුවා ය.

3. අයියා කිරි වීදුරුව ........................................................................................ බිව්වේ ය.

(10) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරුවලින් ලියන්න.



| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |



| | | | | |
|---|---|---|---|---|
| | | | | |

(11) හිස්තැනට ගැළපෙන ඉංග්‍රීසි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

What …...................... your School ? ( are , is )

(12) වචන ගළපා අර්ථවත් වාක්‍ය සාදන්න.

1. father / my / is / This

----------------------------------------------------------------------

2. sing / song ? / you / a / Can

----------------------------------------------------------------------

(13) පහත දෙමළ වාක්‍යවල අර්ථය සිංහල අකුරෙන් ලියන්න.

නාන් උළ්ළේ වරලාමා ?

----------------------------------------------------------------------

(14) පහත වාක්‍යයේ දෙමළ අර්ථය සිංහලෙන් ලියන්න.

මට පොත දෙන්න

----------------------------------------------------------------------

(15) මම කොළයක තිබූ පුංචි බිත්තරයකින් එළියට පැමිණ කොළ කැමෙන් කුස පුරවාගෙන කෝෂයක් තුළ සැඟව සිට උපතේ දී අවලස්සන දළඹුවෙක් වී ලස්සන සමනලයෙක් ලෙස කෝෂයෙන් එළියට ආවෙමි. " මම සමනලයෙක්මි " යන මාතෘකාව යටතේ නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතුව වාක්‍ය තුනක් ලියන්න.

1. ----------------------------------------------------------------------

----------------------------------------------------------------------

2. ----------------------------------------------------------------------

----------------------------------------------------------------------

3. ----------------------------------------------------------------------

----------------------------------------------------------------------

(16)

| | |
|---|---|
| 9 | 7 |
| 3 | 6 |

කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ල භාවිත කර ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව ලියන්න.

----------------------------------------------------------------------

(17) අටදහස් නවය ඉලක්කමෙන් ලියන්න.

----------------------------------------------------------------------

(18) රටාව හඳුනාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

1) 31 , 36 , 41 , ..............................

2) 1 , 7 , 13 , ..................

(19) විහිදුවා ලියන්න.

9 775 - ----------------------------------------------------------------------

(20) විද්‍යාල දෙකක ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.



2258

ගැමුණු විද්‍යාලය



4126

පැරකුම් විද්‍යාලය

1. ගැමුණු හා පැරකුම් විද්‍යාල දෙකෙහි ඉගෙනුම ලබන මුළු සිසුන් ගණන කිය ද?

------------------------------------------------------------------------------------------------

2. ගැමුණු විද්‍යාලය ට වඩා පැරකුම් විද්‍යාලයේ සිසුන් කොපමණ වැඩි ද?


------------------------------------------------------------------------------------------------

(21) ඇපල් ගෙඩි 60 කින් $\frac{3}{4}$ ක් විකුණන ලදී.

1. විකුණන ලද ඇපල් ගෙඩි සංඛ්‍යාව කොපමණ ද? ------------------------------------------------

2. ඉතිරි ඇපල් ගෙඩි සංඛ්‍යාව කොපමණ ද? -------------------------------------------------------

(22) පහත දී ඇති වේලාවට වඩා මිනිත්තු 30 කට පසු වේලාව ඔරලෝසු මුහුණතේ නිවැරදිව දක්වන්න.




වේලාව 10.30


(23) පහත දී ඇති බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | 1kg මිල<br>රු. සත | ප්‍රමාණය | මුදල<br>රු. සත |
|---|---|---|---|
| සහල් | 110.00 | 2kg | .............................. |
| සීනි | .............................. | 3kg | 390 00 |
| පරිප්පු | 180.00 | 500g | .............................. |
| එකතුව | | | .............................. |

(24) එක් වට්ටක්කා ගෙඩියක බර 4kg 550g කි. අනෙක් වට්ටක්කා ගෙඩියේ බර 5kg 675g කි. වට්ටක්කා ගෙඩි දෙකෙහි ම බර කොපමණ ද?

------------------------------------------------------------------------------------------------


(25)



5l 250ml   375ml

ඉහත භාජන දෙකෙහි ජල පරිමා අතර වෙනස කොපමණ ද? ------------------------------------

(26)



මෙම රූපයේ පාට නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.

------------------------------------------------------------


(27) ඇපල් ගෙඩි 420 ක් එක් කවරයකට 5 බැගින් කවර කීයකට දැමිය හැකි ද?

--------------------------------------------------------------------------------------------

(28) පන්ති කාමරයක පුටු 3 බැගින් පේළි 12 ක් ද , පුටු 4 බැගින් ඇති පේළි 8 ක් ද ඇත. එම පේළිවල ඇති මුළු පුටු සංඛ්‍යාව කීය ද?

--------------------------------------------------------------------------------------------

(29) උද්‍යානයක කොටසක් පහත රූපයේ දැක්වේ.





1. ආපණ ශාලාව පිහිටා ඇත්තේ ප්‍රධාන දොරටුවේ සිට කුමන දිශාවෙන් ද?

--------------------------------------------------------------------------------------------

2. රූප සටහනේ දැක්වෙන මාර්ගය ඔස්සේ මිනිසෙකු ප්‍රධාන දොරටුවේ සිට ආපණ ශාලාව හරහා පොකුණ වෙත ගමන් කළේ නම් ඔහු ගමන් කළ දුර සොයන්න.

--------------------------------------------------------------------------------------------

(30)



සිලින්ඩරයක් මෙම කඩ ඉරි ඔස්සේ සමාන කොටස් දෙකකට වෙන් කළ පසු එහි එක කොටසක සෑදෙන සෘජු දාර ගණන කීය ද?

------------------------------------------------------------------------

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(31) බෝ නොවන රෝගයක් වන්නේ,
(1) අධික රුධිර පීඩනය   (2) පැපොල   (3) සරම්ප


(32) “ගිරෙන් ගිරට පැන - ලැගුම් සොයා පුබුදමින් අරුණ කළ මා ” යන කවිය ඇතුළත් වන්නම වන්නේ,
(1) ගජගා (2) හනුමා (3) වෙවරොඩි
(33) ස්වාභාවික අනතුරක් වන්නේ,
(1) නාය යාම (2) කොරෝනා (3) විදුලි සැර වැදීම.
(34) බීම බෝතල් දවටනවල සීනි අඩු ප්‍රමාණය දැක්වෙන වර්ණය වන්නේ,
(1) කහ (2) රතු (3) කොළ
(35) දියෙහි ගිලෙන අයෙකුට අල්ලා ගැනීමට යෙදිය හැකි ආරක්ෂිත ද්‍රව්‍යයක් නොවන්නේ,
(1) පියන ඉවත් කළ ප්ලාස්ටික් බූලියක් (2) පියන වැසූ ප්ලාස්ටික් බූලියක්
(3) ලෝහ භාජනයක්
(36) රෝපණයට සුදුසු බීජයක ලක්ෂණයක් නොවෙයි.
(1) පිට පොත්ත තුවාල සහිත වීම. (2) හොඳින් මෝරා තිබීම. (3) කෘමින් හානි නොකර තිබීම.
(37) නිතර ක්ෂණික ආහාර ගැනීමෙන් ඇති විය හැකි රෝගී තත්ත්වයකි,
(1) ගලගණ්ඩය (2) පිළිකා (3) සෙංගමාලය
(38) “ සුව සැරිය ” ගිලන් රථ සේවය ලබා ගැනීමට ඇමතිය යුතු දුරකථන අංකය වන්නේ,
(1) 1969 (2) 1990 (3) 1919
(39) ශ්‍රී ලංකාවේ ප්‍රමිති සහතිකය භාණ්ඩයක සටහන් කර ඇත්තේ,
(1) ISO ලෙස ය. (2) SLS ලෙස ය. (3) PHI ලෙස ය.
(40) රාත්‍රී ඉතිරිවන බත් ප්‍රයෝජනයට ගත හැකි හොඳ ම ක්‍රමයකි,
(1) ශීතකරණයේ යෙදීම. (2) අව්වේ දමා වේලා ගැනීම.
(3) මුට්ටියට ජලය දමා උදෑසනට දියබත් සාදා ආහාරයට ගැනීම.
(41) දී ඇති ක්‍රියාකාරකමෙන් නිගමනය කළ හැක්කේ,



(1) ජලය ඝනීභවනය වන බව ය.
(2) ජලය වාෂ්ප වන බව ය.
(3) හැන්ද හොඳින් රත්වන බව ය.

(42) අනුරාධපුර රාජධානිය බවට පත් කර ගත් පළමු රජතුමා කවු ද?
(1) ගැමුණු රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා (3) ධාතුසේන රජතුමා
(43) ඌව පළාතට අයත් වන දිස්ත්‍රික්ක දෙක වන්නේ ,
(1) බදුල්ල , මොනරාගල (2) රත්නපුරය , කෑගල්ල (3) පුත්තලම , කුරුණෑගල

(44) දී ඇති විද්‍යුත් චුම්භකයේ චුම්බක බලය වැඩි කර ගැනීමට කළ හැකි ක්‍රියාකාරකමකි.



(1) යකඩ ඇණය රත් කිරීම.
(2) ඇල්පෙනෙති ප්‍රමාණය වැඩි කිරීම.
(3) වියළි කෝෂ ප්‍රමාණය වැඩි කිරීම.

(45) ඉදිරියට මෙන්ම පිටුපසටද පියාසර කළ හැකි කෘමියෙකි,
(1) පැණි කුරුල්ලා (2) බත්කූරා (3) ගිරවා
(46) රට තුළ ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධානයකි,
(1) ටෙලිකොම් ආයතනය (2) රතු කුරුස සංගමය (3) ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය
(47) මල් ඖෂධීය පානයක් ලෙස තම්බා පානයට ගන්නා ශාකයකි,
(1) තේ (2) රණවරා (3) කොත්තමල්ලි

(48) ශාක පිළිබඳ කියවෙන " ඈහැළ මලින් ගස් පිරිලා බලන්න හරි ලස්සනයි " ගීතය ඇතුළත් නාට්‍ය කුමක් ද?

(1) කදා වළලු (2) මනමේ (3) නරි බෑනා

(49) පෘථිවියේ මුළු ජල පරිමාවෙන් බීමට සුදුසු ජලය ඇත්තේ ,

(1) 97% කි. (2) 2% කි. (3) 1% කි.

(50) බෝවන රෝගයක් පැතිර යන විට එය දැනුම් දිය යුතු වන්නේ හෝ දැනුම් දිය යුතු හොඳම තැනැත්තා වන්නේ,

(1) ප්‍රධාන පොලිස් පරීක්ෂකතුමා

(2) මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා


(3) ප්‍රාදේශීය ලේකම්තුමා

(51) ශ්‍රී ලංකාවේ පළමු වැව හා එය සෑදීමට මූලික වූ රජතුමා අයත් පිළිතුර වන්නේ,

(1) කලා වැව - ධාතුසේන රජු (2) බසවක්කුම වැව - පණ්ඩුකාභය රජු

(3) මින්නේරිය - මහසෙන් රජු

(52) පහත චුම්බක දෙක ළං කරන විට ඒවා,




(1) විකර්ෂණය වේ. (2) ආකර්ෂණය වේ. (3) කිසිවක් සිදු නොවේ

(53) ආදි වාසීන්ගේ සංස්කෘතික ශාන්තිකර්මයකි,

(1) කොහොඹ කංකාරිය (2) කිරි කොරහා නැටුම (3) වඩිග පටුන නැටුම

(54) එක් තැනක ඇති පස් තවත් තැනකට ඉවත්ව යෑම හඳුන්වනු ලබන්නේ,

(1) පාංශු ඛාදනය ලෙස ය. (2) පාංශු සංරක්ෂණය ලෙස ය. (3) පාංශු වර්ධනය ලෙස ය.

(55) දෙමංහන්දිය ග්‍රාමයේ සුනබයින් සඳහා ලබන ඉරිදා දින පෙ.ව. 8.30 සිට ප.ව.2.00 දක්වා ජලභීතිකා එන්නත විදිනු ලබයි. මෙය ජනතාව දැනවුත් කිරීමට වඩාත් සුදුසු මාධ්‍යය වන්නේ,

(1) ගුවන් විදුලිය (2) රූපවාහිනිය (3) ශබ්ද විකාශන යන්ත්‍රය

(56) රාජ්‍ය ලාංඡනයේ රට හා විනය ගරුක ජනතාවක් නිරූපණය වන්නේ,

(1) පුන් කලසින් (2) ඉර හා හඳ මගින්

(3) පලාපෙති මැද කඩුව අතින් ගත් සිංහයා

(57) වැඩිපුර සීනි හා පිෂ්ටය අඩංගු ආහාර ගැනීමෙන් ලොකු කුඩා භේදයකින් තොරව ඇති විය හැකි රෝගයකි,

(1) අධි රුධිර පීඩනය (2) දියවැඩියාව (3) හෘදයාබාධ

(58) සිතියමක මහා මාර්ග , දුම්රිය මාර්ග , අධිවේගී මාර්ග දැක්වීමට යොදාගෙන ඇති වර්ණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) දම් , රතු , කළු (2) රතු , කළු , දම් (3) කළු , දම් , රතු

(59) ජලය ඝන , ද්‍රව , වායු යන තුන් ආකාරයෙන් ම දැකිය හැක. මෙම ප්‍රකාශය ,

(1) නිවැරදි ය. (2) වැරදි ය. (3) කිව නොහැකි ය.

(60) ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ හා වරාය පිහිටා ඇති නගර දෙක වන්නේ,

(1) කටුනායක - කොළඹ (2) මත්තල - හම්බන්තොට (3) පලාලි - ත්‍රිකුණාමලය